රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශය
பொது நிருவாக, மாகாண சபைகள் மற்றும் உள்ளூராட்சி அமைச்சு
Ministry of Public Administration, Provincial Councils and Local Government

ස්වදේශ කටයුතු අංශය
உள்நாட்டலுவல்கள் பிரிவு
Home Affairs Division

"නිල මැදුර", ඇල්විටිගල මාවත, කොළඹ 05.
"நில மெதுர", எல்விடிகல மாவத்தை, கொழும்பு 05
"Nila Madura", Elvitigala Mawatha, Colombo 05.

TP : +94 112 050 450
Fax : +94 112 369 971
Email: info@moha.gov.lk
Web : www.moha.gov.lk

මගේ අංකය / எனது இல / My No: HA/3/13/2-3
ඔබේ අංකය / உமது இல / Your No:
දිනය / திகதி / Date: 2026.07. 17

සියලුම දිස්ත්‍රික් ලේකම්වරුන් /දිසාපතිවරුන්

සියලුම ප්‍රාදේශීය ලේකම්වරුන්

**ග්‍රාම නිලධාරීන් විසින් පදිංචි සහතික (DS4) නිකුත් කිරීම සඳහා ලබා දී ඇති පොදු උපදෙස් පිළිබඳව පැහැදිලි කිරීම**

උක්ත කරුණට අදාළව මාගේ සමාංක හා 2025.09.25 දිනැති ලිපියේ සඳහන් උපදෙස් සම්බන්ධව ග්‍රාම නිලධාරි වෘත්තීය සංගම් හා සේවාලාභීන් විසින් ඉදිරිපත් කරන ලද කරුණු සැළකිල්ලට ගෙන එම කරුණුවලට අදාළව තවදුරටත් පැහැදිලි කිරීම් පහත පරිදි වේ.

I. මෙම මාර්ගෝපදේශය පදිංචි සහතික නිකුත් කිරීම සඳහා ලබාදෙන ලද පොදු උපදෙස් ලෙස සැළකිය යුතු අතර ග්‍රාම නිලධාරින් සතුව තොරතුරු පවතින හා පැවතිය යුතු අවස්ථාවලදී විවිධ ලේඛන ඉදිරිපත් කරන ලෙස සේවාලාභීන්ට දැන්වීමෙන් වැළකිය යුතුය.

II. "විවාහක/අවිවාහක බව'' (Civil Status) ලෙස සඳහන් කර ඇති තීරයේ විවාහකද, වැන්දඹුද, නීතියෙන් වෙන් වී ඇතිද යන්න පැහැදිලිව තහවුරු වේ නම් ඒ බව සඳහන් කිරීම හා අවිවාහක ලෙස සඳහන් කිරීම ඉල්ලා සිටී නම් පමණක් දිවුරුම් ප්‍රකාශයක් මඟින් ඉල්ලුම්කරුගෙන් ඒ බව තහවුරු කර ගැනීමෙන් පසු "දිවුරුම් ප්‍රකාශයකින් සනාථ කරයි" යනුවෙන් එම ස්ථානයේ සටහන් කිරීම හෝ වෙනත් කරුණු යටතේ එසේ සඳහන් කිරීම. එහිදී දිවුරුම් ප්‍රකාශය ගොනු කර තබා ගත යුතුය.

ඒ අනුව, පදිංචි සහතිකය අවශ්‍ය කාරණයට අදාළව විවාහක /අවිවාහක බව සඳහන් කිරීම අවශ්‍ය නොවන්නේ නම්, එම තීරයේ "අදාළ නොවේ'' යන්න සටහන් කිරීම ප්‍රමාණවත් වන අතර එවැනි අවස්ථාවලදී සිවිල් තත්ත්වය තහවුරු කර ගැනීමට ලේඛන ඉල්ලා සිටීමේ අවශ්‍යතාවයක් නොමැත.

III. තවද, උප ලේඛන 01හි සඳහන් කර ඇති ලේඛන පදිංචිය තහවුරු කර ගැනීම සඳහා උපකාර කරගත හැකි ලේඛන වන අතර පදිංචි සහතිකයක් ලබා ගැනීම සඳහා ඒවා අනිවාර්ය නොවන බවද සැළකිල්ලට ගත යුතුය.

එස්. ආලෝකබණ්ඩාර
ලේකම්
රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශය

පිටපත්-

01. සියලුම අමාත්‍යාංශ ලේකම්වරුන් - කරු.ඔබ යටතේ පවතින අදාළ දෙපාර්තමේන්තු හා ආයතන දැනුවත් කිරීම සඳහා

02. මැතිවරණ කොමසාරිස් ජනරාල් - කරු.දැ.ගැ.පි